4

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date } 2021 . 01 . 13

පැමිණිලිකාරිය : පී.වී.පී. දර්ශණී මිය,
නො : 279/2/3,
පහළ කරගහමුණ.

වගඋත්තරකරුවන් : සභාපති,
පොල් සංවර්ධන අධිකාරිය,
නො : 11, ආදිපාද වීදිය
කොළඹ 01.

<u>පැමිණිලි අංක : **HRC/2213/16**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා වගඋත්තරකාර අධිකාරියෙහි වැඩසටහන් සහකාර (අළෙවි පර්යේෂණ) වශයෙන් සේවය කරන බවත්, තමා සමඟ මෙම සේවයට බැඳුනු සියළුම නිලධාරීන් හට උසස්වීම් ලබා දීමට පොල් සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කරමින් ඔවුන් වෙත සහකාර අධ්‍යක්ෂක තනතුරු හා විධායක iv ශ්‍රේණියේ තනතුරු මේ වන විට ලබා දී ඇතත්, තමා මේ වන තෙක්ම බඳවාගත් තනතුරේම තබා ඇති බවත්ය.

පසුව ආර්ථික පර්යේෂණ නිලධාරි තනතුරට අදාළව අයදුම්පත් කැඳවන ලදුව තමා විසින් ඊට අදාළ සියළු සුදුසුකම් සපුරා තිබීම හේතුවෙන් ඒ සඳහා අයදුම්පත් යොමු කරන ලද බවත්, සම්මුඛ පරීක්ෂණය සඳහාද පෙනී සිටි බවත්, එම සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු ප්‍රමාණය උපයාගන්නා ලද නමුත් නොයෙකුත් හේතුන් දක්වමින් එම තනතුර තමා වෙත ලබා නොදුන් බවත් සඳහන් කර ඇත. එසේම තමා සමඟ පත්වීම් ලැබ හා ඉන් පසුව බඳවාගනු ලැබූ පුරප්පාඩු වලට අයදුම්කළ සියළු උපාධිධාරීන් හට තනතුරු උසස්වීම් ලබා දී ඇති බවත්. එහෙත් තමා විසින් ඉල්ලා සිටින ලද තනතුර තවමත් පුරප්පාඩුව පවතින



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් සලකා බලා සුදුසුකම් සපුරා ඇති තමා හට අදාළ තනතුර ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම ඃ-

මෙම පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශවය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. ආර්ථික පර්යේෂණ නිලධාරි තනතුරට සුදුස්සන් තෝරා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණය 2016.04.20 වන දින පවත්වා ඇති බවත්, ඒ සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන් 04 දෙනෙකු සහභාගී වී, අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව සුදුසුකම් සපුරා තිබීම හේතුවෙන් පැමිණිලිකාරියද ඇතුළුව අභ්‍යන්තර අයදුම්කරුවන් 04 දෙනෙකු කැඳවා ඇති බවත් සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තනතුරෙහි කාර්යභාරයට අදාළ පර්යේෂණ කටයුතු කිරීම, දත්ත විශ්ලේෂණය, පරීක්ෂණ වාර්තා සැපයීම සහ පර්යේෂණ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඇත. එසේම එක් එක් අයදුම්කරුවාගේ ප්‍රවේශය පිළිබඳව සැළකිල්ලක් දක්වා ඇති අතර, මේ සම්බන්ධයෙන් අයදුම්කරුවන් ලබාදුන් පිළිතුරු ප්‍රමාණවත් සහ ගුණාත්මක බවෙන් තොර සහ පරිපූර්ණ නොවන බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නිරීක්ෂණය කර ඇති බවද දක්වා ඇත. එබැවින් අදාළ තනතුර සඳහා සුදුසු අයදුම්කරුවකු තෝරා ගැනීම වෙනුවෙන් පුවත්පත් දැන්වීම් මගින් විවෘත අයදුම්පත් කැඳවීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය ඒ සඳහා අනුමැතිය ලබාදී ඇති බවද දක්වා ඇත.

නිරීක්ෂණ හා නිගමනය ඃ-

වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලකුණු ලබාදීමේ සටහන් කෙරෙහි මානව හිමිකම් කොමිෂන් සභාවෙහි අවධානය යොමුකර ඇති අතර. සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වූ අයදුම්කරුවන් 04 දෙනා ලකුණු 56, ලකුණු 30, ලකුණු 22, ලකුණු 20 ක් වශයෙන් ලබාගෙන ඇත. ඒ අතරින් ලකුණු 56 ක් ලැබූ පැමිණිලිකාරිය සෙසු අයදුම්කරුවන්ට සාපේක්ෂව වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා පළමු ස්ථානයේ රැඳී සිටින බව නිරීක්ෂණය වේ. අදාළ අමතර පළපුරුද්ද සඳහා නියමිත ලකුණු 30 න් 30 ම පැමිණිලිකාරිය විසින් ලබාගෙන ඇති අතර. අමතර සුදුසුකම් සඳහා නියමිත ලකුණු 30 න් 09 ක් පැමිණිලිකාරියට ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. සාධන මට්ටම (Achievements) සඳහා නියමිත ලකුණු 15 න් 02 ක් පැමිණිලිකාරියට ලබාදී ඇති අතර. සම්මුඛ පරීක්ෂණයේදී දැක්වූ දක්ෂතා වෙනුවෙන් ලබාදීමට නියමිත ලකුණු 25 න් 15 ක් පැමිණිලිකාරියට ලැබී ඇත. ඒ අනුව මුළු ලකුණු 56 ක් හිමි පැමිණිලිකාරිය පළමුවන ස්ථානයේ ශ්‍රේණිගත කර ඇති බවද නිරීක්ෂණය වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාළ ලකුණු ලබාදීමේ ලේඛනයෙහි දක්වා ඇත්තේ අයදුම්කරුවන් ලබාදුන් පිළිතුර ප්‍රමාණවත් හා ගුණාත්මක බවෙන් තොර හා පරිපූර්ණ නොවන බව තමන් නිරීක්ෂණය කළ බැවින් පුවත්පත් දැන්වීමක් මගින් විවෘත අයදුම්පත් කැඳවා සුදුස්සකු තනතුර සඳහා තෝරා ගත යුතු බවයි.

තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව අවශ්‍ය මූලික සුදුසුකම් පැමිණිලිකාරිය විසින් සම්පූර්ණ කර ඇත. වාණිජවේදී උපාධිය දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් පැමිණිලිකාරිය කැලණිය විශ්ව විද්‍යාලය වෙතින් ලබා ඇති අතර, බඳවා ගැනීමේ පරිපාටියෙන් දක්වා ඇති සංඛ්‍යානය විෂයද ඊට ඇතුළත්ය. (Correlation Regression Analysis, Cronbach Alpha, Descriptive Analysis Standard Deviations) 2 වන සංඛ්‍යානය විෂය සහ Cost Benefit Analysis යන විෂයන් පැමිණිලිකාරිය සිය උපාධිය විෂයන් තුළින්ම හදාරා ඇත. එසේම වගඋත්තරකාර අධිකාරියේ වැඩසටහන් සහකාර වශයෙන් පැමිණිලිකාරියට වසර 12 කට අධික කාලයක් අලෙවි අංශයට අදාළ පළපුරුද්ද ඇති බවද නිරීක්ෂණය වේ. ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලබාදීමට නියමිත ලකුණු 30 න් ලකුණු 30 ම පැමිණිලිකාරිය වෙත ප්‍රදානය කර තිබීමද විශේෂත්වයකි. සම්මුඛ පරීක්ෂණයේදී වැඩිම ලකුණු හිමිකරගත් පැමිණිලිකාරියට ප්‍රමාණාත්මක හා ගුණාත්මක දැනුමක් නැතැයි නිර්දේශ කිරීම තුළින් පැමිණිලිකාරියගේ අධ්‍යාපනික සුදුසුකම් සේම අධිකාරිය තුළ වසර 12 ක අත්දැකීම් පවා අවතක්සේරු කර ඇති ලෙසක් ගම්‍ය වේ. වසර 12 ක් පුරා පැමිණිලිකාරියට කිසිදු උසස්වීමක් ලබා නොදීම යන කාරණය කෙරෙහි මානව හිමිකම් කොමිෂන් සභාවෙහි විශේෂ අවධානය යොමු වී ඇත.

මේ වන විට පැමිණිලිකාරිය විසින් බඳවා ගැනීමේ පරිපාටිය තුළ අන්තර්ගත නැතත් ආර්ථික විද්‍යාව (පර්යේෂණ) ශාස්ත්‍රපති උපාධියද හදාරමින් සිටින බවටද කරුණු ඉදිරිපත්ව ඇත. විවෘත අයදුම්පත් කැඳවා වෙනත් අයකු තෝරා ගැනීමේදී අධිකාරියේ වසර 12 ක පැමිණිලිකාරියගේ සේවා පළපුරුද්ද සැසඳිය හැකිද යන්න ගැටලුවකි. ඉහත කී සියලු කරුණු කාරණාවන් සලකා බැලීමේදී ආර්ථික පර්යේෂණ නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සියළු සුදුසුකම් සපුරා ඇති පැමිණිලිකාරිය ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු 56 ක් ලබා පළමු ස්ථානයට පත්ව සිටියදීත් පැමිණිලිකාරිය එම තනතුරට පත් නොකිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය ඃ-

මේ අනුව ආර්ථික පර්යේෂණ නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සියළු සුදුසුකම් සපුරා ඇති පැමිණිලිකාරිය ඊට අදාළ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු 56 ක් ලබා පළමු ස්ථානයට පත්ව සිටින බැවින් පැමිණිලිකාරිය ආර්ථික පර්යේෂණ නිලධාරි තනතුරට පත්කිරීමට කටයුතු කළයුතු බවට වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.03.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anushya Shanmuganathan**
Commissioner
B/ **Human** Rights Commission of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි.
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka